# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2352/10 - 2023 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා - 2023.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වන වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 15 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
'' සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - PG 6491— 21 (2023/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

*වැලිමඩ නාගරික බල ප්‍රදේශය පුළුල් කිරීම*

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරිය බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ අංක 1210/16 හා 2001.11.16 වැනි දින දරන ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ නාගරික බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 52-ඩී වැලිබඩ ග්‍රාම නිලධාරි වසමද, අංක 52-බී ලන්දේගම ග්‍රාම නිලධාරි වසමද, අංක 59-ඩී දිවිතොටවෙල ග්‍රාම නිලධාරි වසමද, අංක 48 අඹගහකුඹුර ග්‍රාම නිලධාරි වසම ද , අංක 59-ඒ දඹවින්න ග්‍රාම නිලධාරි වසමේ කොටසක්ද, අංක 48-ඒ දිවුරුම්ගම ග්‍රාම නිලධාරි වසමේ කොටසක්ද, මීට අමතරව අංක 50-එච් දිමුතුගම ග්‍රාම නිලධාරි වසමද, අංක 50-ඩී පාලුගම ඇල්ල ග්‍රාම නිලධාරි වසමද, අංක 50-අයි පුරන්වෙල ග්‍රාම නිලධාරි වසමද, අංක 50 පාලුගම නගරය ග්‍රාම නිලධාරි වසමද, අංක 48-ඒ දිවුරුම්ගම ග්‍රාම නිලධාරි වසමේ කොටසක්ද, අංක 59-ඒ දඹවින්න ග්‍රාම නිලධාරි වසමේ කොටසක්ද යන ග්‍රාම නිලධාරි කොට්ඨාස මගින් සමන්විත වූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මායිම්වලින් සමන්විත වූ මුළුමහත් භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

*උතුරට* :

වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අංක 50, පාලුගම නගරය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම (A5) පේරාදෙණිය 01 - චෙන්කල්ලඩි ප්‍රධාන මාර්ගය සමග ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී එම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ නැගෙනහිර, ඊශාන, ගිණිකොන දිශානුගතව ඇඳී රේඛාව අංක 50 අයි පුරංවෙල ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට අංක 50 අයි පුරංවෙල ග්‍රාම නිලධාරි වසමේ උතුරු, ඊශාන දිශානුගතව ඇඳි රේඛාව අංක 48 බී ගිරාඹේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂය දක්වාද එතැන් සිට එම ග්‍රාම නිලධාරි වසමේ දකුණු දිශානුගතව ඇඳි රේඛාව 48 ඒ දිවුරුම්ගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද එතැන් සිට එම ග්‍රාම නිලධාරි වසමේ ඊශාන, වයඹ, නැගෙනහිර, ගිණිකොන දිශානුගතව ඇඳි රේඛාවට අංක 48 අඹගහකුඹුර ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර, දකුණ, නැගෙනහිර, වයඹ, බස්නාහිර, උතුර, නැගෙනහිර, දකුණ, නැගෙනහිර, උතුර, වයඹ, ඊශාන, බස්නාහිර, උතුර, නැගෙනහිර, ඊශාන, දකුණ, නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව උමා ඔයේ මධ්‍ය ලක්ෂ්‍යය හමුවන තෙක් ද, එතැන් සිට වැලිමඩ නගරය ග්‍රාම නිලධාරි වසමේ වයඹ මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට වැලිමඩ නගරය ග්‍රාම නිලධාරි වසමේ ඊශාන, නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව උඩුපුස්සැල්ලාව-වැලිමඩ (බී-471) මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය හමුවන තෙක්ද එතැන් සිට එම ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර, නිරිත, ගිණිකොන දිශානුගතව ඇඳි රේඛාව උමා ඔයෙහි මධ්‍ය ලක්ෂ්‍යය හමුවන තෙක්ද එතැන් සිට එම රේඛාව උමා ඔයෙහි මධ්‍ය ලක්ෂ්‍යය දිගේ දිවිතොටවෙල ග්‍රාම නිලධාරි වසමේ වයඹ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද

*නැගෙනහිරට* :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 50-ඩී දිවිතොටවෙල ග්‍රාම නිලධාරි වසමේ වයඹ මායිම ඔස්සේ දකුණු දිශානුගතව ඇඳි රේඛාව උක්වත්තේ කඳුර මධ්‍ය ලක්ෂ්‍යය දිගේ 59-ඒ දඹවින්න ග්‍රාම නිලධාරි වසමේ B-44 මාර්ගය මධ්‍යම මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද එතැන් සිට එම ග්‍රාම නිලධාරි වසමේ ගිණිකොන, නැගෙනහිර, ගිණිකොන, නිරිත දිශානුගතව ඇඳි රේඛාව B-508 මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද

*දකුණට* :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 59ඒ දඹවින්න ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ වැලිමඩ බොරලන්ද (B-48) මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය ඡේදනය කරමින් ඇඳි රේඛාව බස්නාහිර දිශානුගතව ගල්පොත්ත කඳුරෙහි මධ්‍ය ලක්ෂ්‍යය හමුවන තෙක් ගමන්කොට ඉන් අනතුරුව එම රේඛාව උතුර වයඹ

*උපලේඛනය (සම්බන්ධිතයි)*

***වැලිමඩ නාගරික බල ප්‍රදේශය පුළුල් කිරීම***

*I වැනි තීරුව*

EOG 10 - 0011

*II වැනි තීරුව*

දිශානුගතව කුඩා ඔය මධ්‍ය ලක්ෂ්‍යය තෙක්ද, ඉන් අනතුරුව කුඩා ඔය මධ්‍ය ලක්ෂ්‍යය දිගේ නිරිත දිශානුගතව ඇඳි රේඛාව 50 අයි පුරන්වෙල ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක් ගමන්කොට ඉන් පසුව එම ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ බස්නාහිර, වයඹ, නිරිත දිශානුගතව ඇඳි රේඛාව B353 කැප්පෙටිපොල බොරලන්ද මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය හමුවන තෙක්ද,

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයෙන් ආරම්භ වන අංක 50 පාලුගම නගරය ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ ඇඳි රේඛාව නිරිත, වයඹ, බස්නාහිර හා උතුර දිශානුගතව ගමන් කොට (A5) පේරාදෙණිය - වෙන්කලඩි මාර්ගයේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ඇතුලත් මුළු භූමි ප්‍රදේශයම වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.